# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,685/3—1966 මාර්තු 7 වැනි සඳුදා—7.3.1966

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

### අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන

අ. ආ. කා. අංකය: ඩබ්ලිව්. 68/66 (3)

**අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් කරනු ලබන ප්‍රකාශනයකි**

මුද්‍රාව

ඩබ්ලිව්. ගොපල්ලව

ලංකාවෙහි මහාජන හදිසි තත්ත්වයක් පැවතීම හේතු කොට ගෙන, මහාජන ආරක්ෂාව, මහාජන සාමය සුරක්ෂිත කිරීම හා මහාජන ජීවිතයට අත්‍යවශ්‍ය වූ සැපයීම් හා සේවාවන් ද පවත්වා ගෙන යාම සඳහා එසේ කිරීම අවස්ථානුකූල ය යි මා අදහස් කරන හෙයින් :

අග්‍රාණ්ඩුකාර තැන්පත් විලියම් ගොපල්ලව වන මම, 1959 අංක 8 දරන පනතින් සංශෝධනය කරනු ලැබූ (40 වෙනි අධිකාරය වන) මහාජන ආරක්ෂක ආඥාපනතේ 2 වෙනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර ඒ ආඥාපනතේ II කොටසේ විධිවිධාන, ලංකාව මුළුල්ලේම එක් දහස් නවසිය හැට හයක් වූ මාර්තු මස අට වෙනි දින ක්‍රියාත්මක විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

වර්ෂ එක් දහස් නවසිය හැට හයක් වූ මාර්තු මස හත් වෙනි දින කොළඹ දී අත්සන් කර දෙන ලදී.

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාර තැනගේ ලේකම්.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි නැගෙනහිර කඩදාසි සංස්ථාවෙහි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි

358/5—ආර් 12502—11,600 (66/2)